**ජාතික අධ්‍යාපන ආයතනය - 2019**
**-------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී වියදමට හිලව්කල ආදායම රු. 840,299 ක් විය. | එකඟවන බවත් නිවැරදි කිරීමට කටයුතු කරන බවත් | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව පාරිතෝෂිත වෙන් කිරීම් රු. 72,000 ක් , වත්කම් විකිණීම් රු.2,023,600 ක් හා වත්කම් ඉවත් කිරීමේ ලාභය රු. 840,299 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නියමිත පරිදි දක්වා නොතිබුණි. එසේම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් රු.2,733,570 ක ගැලපිලි සඳහා උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | එකඟවන බවත් නිවැරදි කිරීමට කටයුතු කරන බවත් | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාල වත්කම් පංතියම ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් ඊට පටහැනිව වාහන ප්‍රත්‍යාගණනයේදී පිරිවැය රු.14,600,000 ක් වූ වාහන 04 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | එකඟවන බවත් නිවැරදි කිරීමට කටයුතු කරන බවත් | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී කල් පිරි තිබුණු භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කල රු.19,826,596 ක මුදල ආයෝජන අදායමක් ලෙස ගිණුම් ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | එකඟ වන බවත් නිවැරදි කිරීමට කටයුතු කරන බවත් | වර්ෂයේ ආදායම නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යංශයෙන් ලැබුණු රු.103,041,957 ක ප්‍රාග්ධන ප්‍රදාන පුනරාවර්තන ආදායම් ලෙස ගිණුම් ගතකර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | අධ්‍යාපන අමාත්‍යංශයේ ප්‍රාග්ධන වැය ශීර්ෂයෙන් ලබා දුන්න ද ජාතික අධ්‍යාපන ආයතනයේ අයවැය ලේඛනයට අනුව පුනරාවර්තන ආදායම් ලෙස ඇස්තමේන්තු කර ඇති බව | නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

**1.5.4 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවැති ආපසු ගෙවිය යුතු තැන්පතු රු.1,887,031 ක් නිරවුල් කිරීමට හෝ වගකීම් කාලය ඉකුත් වූ තැන්පතු ආදායමට ලියා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි. | වර්ෂ 05 ඉක්ම වූ ශේෂයන් ආදායම් ගත කිරීමට ඉදිරි වර්ෂයේදී කටයුතු කරන බව | නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2006 වර්ෂයේ සිට 2015 දක්වා කාලයට අදාල ගෙවිය යුතු අර්ථසාධක මුදල් සහ අධිහාර මුදල රු.68,757,865 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි. | ආයතනය විසින් අභියාචනයක් යොමු කරමින් වාරික වශයෙන් ගෙවීම සඳහා ඉල්ලා ඇති බව | නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | | රු. | | |
| (අ) | 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන පනතේ 4 (ක) සහ 28 වගන්ති | ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය පනතේ විධිවිධාන ප්‍රකාරව අනුමත කරගෙන නොතිබුණි. | ඉදිරියේදී අනුමත කර ගැනීමට කටයුතු කරන බව | විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ)) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | II වැනි පරිච්ජේදයේ 13.3 වගන්තිය | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් , අධ්‍යක්ෂ තනතුරු දෙකක් සහ මුදල් අයකැමි තනතුරක් සඳහා 2015,2016,2018 සහ 2019 වර්ෂ වලදී වැඩ බැලීමේ පත්වීම් ලබාදී දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 478,128 ක් ගෙවා තිබුණි. | මෙම වැඩ බැලීමේ පත්වීම් සේවා අවශ්‍යතාවය අනුව අදාළ රාජකාරී ඉටු කිරීමට පත්කර ඇති බවත් අධ්‍යක්ෂ තනතුරු සඳහා දැනට සංශෝධනය වෙමින් පවතින බඳවා ගැනීමේ පටිපාටිය අනුව අලුතෙන් බඳවා ගැනීමට කටයුතු කරන බවත් | කඩිනමින් මෙම තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) | (ii) VIII වැනි පරිච්ජේදයේ 6.1 වගන්තිය | මාසික ඒකාබද්ධ වැටුප (දීමනා හැර) පදනම් කරගෙන අතිකාල ගෙවීම් රේට ගණන් බැලිය යුතු වුවත් 1995 මාර්තු 22 දිනැති අංක ඩි/එස්/811/617/94 | 1995 මාර්තු 22 දිනැති සහකාර කම්කරු කොමසාරිස්ගේ ලිපිය අනුව අතිකාල ගෙවීම් කර ඇති බවත් නිතීපති දෙපාර්තමේන්තුවෙන් සහ කළමණාකරණ | අතිකාල දීමනා ගෙවීමට පදනම් කරගන්නා වැටුප ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයට ඇතුලත් කර විධිමත් |

| | | | | |
|---|---|---|---|---|
| | | දරන සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු ගේ උපදෙස් ලිපියක් පදනම් කරගෙන 2016 වර්ෂයේ සිට දළ වැටුප පදනම් කරගෙන අතිකාල දීමනා ගණනය කර සමාලෝචිත වර්ෂය සඳහා රු.37,226,200 ක් අතිකාල දීමනා ගෙවා තිබුණු නමුත් අතිකාල දීමනා ගෙවීමට පදනම් කර ගන්නා වැටුප ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයට ඇතුළත් කර විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවා දෙපාර්තමේන්තුවෙන් විමසීම් කල පසු සහකාර කම්කරු කොමසාරිස්ගේ නියමයන් වලට මෙම ආයතන වලින් විරුද්ධත්වයක් නොමැති බව දැනුම් දී ඇති බව | පරිදි අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2013 වර්ෂයේදී ආයතනය සඳහා අනුමත කර ඇති අංක 257 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව 2014 සිට 2018 වර්ෂය දක්වා නිලධාරින් 89 දෙනෙකුට රු.6,786,256 ක් ද සමාලෝචිත වර්ෂයේදී නිලධාරින් 09 දෙනෙකුට රු.505,915 ක් ද දීමනා වශයෙන් වැඩිපුර ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට දැනුම් දී මෙම චක්‍රලේඛය සංශෝධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව ගෙවීම් කල යුතුය. |
| (ඇ) | 2010 සැප්තැම්බර් 06 දිනැති අංක 19 සහ 2017 මාර්තු 15 දිනැති අංක 33 දරන අතිරේකයෙන් සංශෝධිත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) වගන්තිය | රු.200,000 ට වැඩි වාහන අළුත් වැඩියා සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතිය ලබා ගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 07 ක දී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව වාහන අළුත් වැඩියා සඳහා රු.2,861,623 ක් ගෙවා තිබුණි. | වාහන අළුත් වැඩියා සිදුකර ඇත්තේ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමෙන් පසුව බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.41,340,476 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.69,346,117 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.110,686,593 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන විදේශීය ප්‍රදාන රු.344,084,500 කින් අඩුවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

---

ආයතනයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී ඉකුත් වර්ෂයේ 3.5:1 ට පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 3.4:1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයේ 3.3:1 ක් හා සමාලෝචිත වර්ෂයේ 3.2:1 ක් ව පැවතුණි. ජංගම වත්කම් වලින් සියයට 80 ක් නියෝජනය කරනුයේ භාණ්ඩාගාර බැඳුම්කර හා බැංකු ජංගම ගිණුම් ශේෂ වන අතර ඒ අනුව ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උසස් පෙළ ගුරුවරුන් සඳහා පැවැත්වෙන අධ්‍යාපනවේදී (ඉංජිනේරු තාක්ෂණවේදය) උපාධි පාඨමාලාවේ ශාස්ත්‍රීය විෂයයන්ට අදාල දේශන හා ප්‍රායෝගික සැසි පැවැත්වීම අවබෝධතා ගිවිසුමකින් තොරව වෘත්තිය තාක්ෂණික විශ්ව විද්‍යාලයට 2015 වර්ෂයේ පවරා තිබුණ ද 2017 වර්ෂයේදී එම ආයතනය දේශන පැවැත්වීමෙන් ඉවත් වී තිබුණි. නැවතත් ගිවිසුමකින් තොරව එම ගුරු සිසුන් 211 ක් විශ්ව විද්‍යාල 04 ට යොමු කර පාඨමාලා ගාස්තු වශයෙන් රු.52,444,398 ක් ගෙවා තිබුණි. එසේම පාඨමාලා හැරගිය ගුරු සිසුන් සමඟ ද ගිවිසුම් වලට නොඑළඹීම නිසා විශ්ව විද්‍යාල 04 ට ගෙවා තිබුණු 96 දෙනෙකුගේ පාඨමාලා ගාස්තු රු.22,644,843 ක් ආපසු අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | විශ්ව විද්‍යාල 04 හි බලධාරීන් සමඟ සාකච්ජා කර වහාම මේ පිළිබඳ එකඟතා ගිවිසුම් ඇති කර ගැනීමට කටයුතු සැලසුම් කරන බව සහ පාඨමාලාව සාර්ථකව අවසන් නොකල ගුරු සිසුන් සම්බන්ධව විමසා බැලීමට කමිටුවක් පත් කිරීමට කටයුතු කරන බව | කඩිනමින් ගිවිසුම් අත්සන් කර පාඨමාලා හැරගිය ගුරු සිසුන් ගෙන් රජය විසින් දරන ලද වියදම් ආපසු අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුල නිලධාරීන් 131 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබුණු රු.2,345,269 ක වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීමට අදාල සංශෝධිත නාම ලේඛනය මුදල් දෙපාර්තමේන්තුව විසින් සකස් කරමින් පවතින බව | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2008 වර්ෂයට පෙර සිට පවතින රු.45,034,652 ක පුස්තකාල පොත් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් කර නොතිබුණු අතර එවායේ උපලේඛනයක් ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පොත්වල සමීක්ෂණ කටයුතු සිදුකරගෙන යන අතර පුස්තකාලයේ පොත් පිළිබඳ නිවැරදි දත්ත ඇතුලත් පොත්වල මිල ගණන් සහිත උපලේඛනයක් සකස්කර මුදල් අංශය වෙත භාරදෙන ලෙස උපදෙස් ලබා දී ඇති බව | එම පුස්තකාල පොත් ශේෂය ගණනය කර වටිනාකම ගිණුම්වල ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිවිසුම් ප්‍රකාරව මීපේ දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසිකාගාරය ඉදිකිරීමේ වසරක කොන්ත්‍රාත් කාලය අධ්‍යක්ෂ (පාසැල් ගොඩනැගිලි) විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර හේතුවක් නිසා ප්‍රමාද වූ බව තහවුරු කර නොගෙන 2019 දෙසැම්බර් 15 දින දක්වා දීර්ඝ කර තිබුණි. 2020 ජූනි 30 දින වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කර වෙනත් කොන්ත්‍රාත් කරුවෙකු වෙත පැවරීමෙන් අමතර කාලයක් සහ පිරිවැයක් වැය වන නිසා කල් දිගුව ලබා දුන් බව | අනුමත කල කාලය තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 මානව සම්පත් කළමණාකරනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ පවතින පුරප්පාඩු 159 ක් සම්පූර්ණ කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | 2013 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක බඳවා ගැනීම් පටිපාටිය අනුව පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට හැකියාවක් නොමැති වී ඇත්තේ බොහොමයක් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් වැඩිපුර දක්වා ඇති නිසා බව | බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කර පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ගත පුනරාවර්තන වියදම් තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 3.9 සිට සියයට 264.3 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අය වැය ලේඛනය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම තත්වය මඟහරවා ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව | අයවැය සකස් කිරීමේදී වාර්ෂිකව ඉටුකල යුතු ප්‍රමුඛතා නිශ්චිතව හඳුනාගෙන අපේක්ෂිත පරිදි එම කාලවකවානු තුළ ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |